# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014 (නැවත)

### 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

### සමාජීයවිද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයනය

### ජනසංඛ්‍යාව සහ සංවර්ධනය DVST E - 1015

ප්‍රශ්න (05) පහකට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව **: 08 යි.** කාලය **: පැය තුනයි** (03)

---

1. ජනසංඛ්‍යාවේ විශාලත්වය රටක ආර්ථික සංවර්ධනයට ශුභවාදී අයුරින් බලපාන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

2. ( i ) කිංස්ලි ඩේවිස් සහ ජුඩිත් බ්ලේක් (1956) විසින් ඉදිරිපත් කරන ලද සාඵල්‍යතාව පිළිබඳ අතරමැදි විචල්‍ය රාමුවෙහි ඇතුලත් සංරචක දක්වන්න. (ලකුණු 08)

   ( ii ) සංවර්ධනය වෙමින් පවතින රටවල් අනුගමනය කරන පවුල් සැලසුම් වැඩසටහන්වල ප්‍රගතිය උදාහරණ මගින් අගයන්න. (ලකුණු 12)

3. ( i ) සංවර්ධිත රටවල මර්ත්‍යතා අනුපාතය කෙරෙහි බලපා ඇති හේතු සාධක හඳුන්වන්න. (ලකුණු 10)

   ( ii ) සංවර්ධිත රටවල ළදරු සහ ළමා මරණ අනුපාතයෙහි සාධ්‍යතා විග්‍රහ කරන්න. (ලකුණු 10)

4. ( i ) ජන සංක්‍රමණ කෙරෙහි බලපාන ඇද ගැනීමේ සාධක (Pull Factors) හා තල්ලු කිරීමේ සාධක (Push Factors ) දක්වන්න. (ලකුණු 10)

   ( ii ) සංවර්ධනය වෙමින් පවතින රටවලින් සංවර්ධිත රටවලට සිදුවන පුහුණු ශ්‍රමවිගමනය හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණපාන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. මෝල්තස් (1798) න්‍යායේ වර්තමාන ව්‍යවහරිකත්වය උදාහරණ මගින් පරීක්ෂා කරන්න. (ලකුණු 20)

6. ( i ) ෆෑන්ක් ඩබ්ලිව් නොටෙස්ටීන් (1950) ඉදිරිපත්කළ ජනවිද්‍යා සංක්‍රාන්ති න්‍යායේ අදියර නම් කරන්න. (ලකුණු 05)

( ii ) "සංවර්ධිත රටවල සිදුවූ ආර්ථික සහ සමාජ සංවර්ධන පරිවර්තන සඳහා බලපෑ ප්‍රධානතම සංසිද්ධියක් ලෙස ජනවිද්‍යා සංක්‍රාන්තිය හඳුනාගත හැකිය." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 15)

7. "ස්ථායි ජනසංඛ්‍යාවක් ඇතිකර ගැනීම තිරසර සංවර්ධන ප්‍රවේශයට අනුගතවීමේදී අත්‍යවශ්‍යය " මෙම ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 20)

8. ( i ) වියපත් ජනසංඛ්‍යාවේ ප්‍රතිශතය ඉහළයාම හේතුවෙන් ඇතිවිය හැකි ආර්ථික සහ සමාජ ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 10)

( ii ) ජනසංඛ්‍යාව වියපත් වීමේ අභියෝගයට සාර්ථකව මුහුණදීම සඳහා සංවර්ධනයවන රටක් වශයෙන් ශ්‍රී ලංකාව ගතයුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

***********************